## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ II ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ නිවේදනය 2025

ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාව අනුව දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී ( II ශ්‍රේණිය ) තනතුරේ පවත්නා පුරප්පාඩු සේවා ප්‍රමුඛතාවය මත හඳුනාගත් තනතුරු 85ක් සඳහා බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් මෙහි 04 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සපුරන දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇමුණුම් ලෙස පුරප්පාඩු ලේඛනය, අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය හා අයදුම්පත ප්‍රසිද්ධ කොට ඇත. අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 08 වන දින සිදු කෙරේ.

02. මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව මාසිකව, රු: රු.91,750-3 X 2,400 – 7×2,420– 2×2,940– 16×3,900-184,170 (SL 2-2025). මෙයට අමතරව රාජ්‍ය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් සපයා ඇති ප්‍රතිපාදන අනුව ගෙවන දීමනාද ඇතුලත් වේ. කෙසේ වුවද ඔබ විසින් මෙම වැටුප් පරිමාණයේ 03 වන වැටුප් පියවරට එළඹීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

03. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන් වලට ඔබ යටත් විය යුතු වේ. තවද ඔබගේ පත්වීම, පත්වීම් ලද දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය. රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝගවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධාවිධානවලටද, මුදල් රෙගුලාසිවලටද, රජය විසින් කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසිවලට සහ නියෝගවලට ද ඔබගේ පත්වීම යටත්ය. තවද පත්වීම ලද දිනයේ සිට වසර 03 ක් ඉකුත් වීමට පෙර 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඔබ විසින් ලබා ගත යුතු අතර එසේ නැතහොත් වැටුප් වර්ධක අත්හිටුවනු ඇත.

04. මෙම බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මගින් පිළිගන්නා විශ්ව විද්‍යාලයකින් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබා ඒකවාර්ෂික සීමාවාසික පුහුණුව සාර්ථකව අවසන් කොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබාගත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන්ය. මෙම පත්වීම සඳහා බඳවා ගැනීමට කුසලතා ලේඛනය සකස් කිරීමේදී ප්‍රමුඛතාවය ලබාදෙනු ලබනේනේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දන්ත වෛද්‍ය පීඨයේ දන්ත ශල්‍ය වෛද්‍යවේදී උපාධිය ලත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් එම පීඨයෙන් නිකුත් කල කුසලතා ලේඛනයට අනුකූලව සහ ඉන් පසුව විදේශීය විශ්ව විද්‍යාල වෙතින් දන්ත ශල්‍ය වෛද්‍ය උපාධිය ලබාගත් දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව ලබාදෙන කුසලතා අනුපිළිවෙළ අනුවය.

05.උපාධිධාරීන්ගේ අයදුම්පත්, කුසලතා ලේඛනයේ අනුපිළිවෙලට අනුව සලකා බලනු ලැබේ. එම කුසලතා ලේඛනය ඇමුණුම II ලෙස මෙම නිවේදනයට අමුණා ඇත.

06. ඉල්ලුම්කරුවන් පහත සඳහන් ලේඛන හෝ පිටපත් (දන්වා ඇති පිටපත් ගණන අනුව) ස්වකීය ඉල්ලුම්පත්‍රයට අමුණා 2026 නොවැම්බර් 08 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කළ යුතුය.

අධ්‍යක්ෂ (දන්ත සේවා),<br>
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,<br>
නො.106, ඩඩ්ලි සේනානායක මාවත,<br>
කොළඹ 08.*

(අ) උප්පැන්න සහතිකයේ මුල් පිටපත් තුනක් (03)**

(ආ) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපත් තුනක් (03)

(ඇ) ජාතික හැඳුනුම්පතේ දෙපසම දැක්වෙන පරිදි ලබා ගත් ඡායා පිටපත් තුනක් (03)

(ඈ) උප්පැන්න සහතිකයේ හා ජාතික හැඳුනුම්පතේහි ඉංග්‍රීසි පරිවර්තන පිටපත් (03)

(රජයේ ලියාපදිංචි භාෂා පරිවර්තකයෙකුගෙන් ලබාගත්)*

07.ඉන්පසු 2026 නොවැම්බර් 09 දින අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කොට ඇති ලේඛන වල මුල් පිටපත් අධ්‍යක්ෂ ( දන්ත සේවා) කාර්යාලයේ නිලධාරීන් විසින් පරීක්ෂාකර සත්‍ය පිටපත් ලෙස තහවුරු කරනු ලැබේ. ඒ සඳහා සියලුම සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතු අතර එම මුල් පිටපත් පරීක්ෂාකර අවසන් වූ විගස අයදුම්කරුවන් වෙත ආපසු ලබා දෙනු ඇත. මෙම සියලු ලේඛන වල නිරවද්‍යතාවය තහවුරු කිරීමෙන් පසු මනාප ස්ථාන තෝරා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භවනු ඇත.*

08.මෙම නිවේදනයට පහත සඳහන් ලේඛන ඇතුලත්ය.

8.1 අයදුම්පත්‍රය (සිංහල/දෙමළ) - ඇමුණුම I

8.2 කුසලතා ලේඛනය (ඉංග්‍රීසි) - ඇමුණුම II

8.3 පුරප්පාඩු ලේඛනය (ඉංග්‍රීසි) - ඇමුණුම III

8.4 අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රය (ඉංග්‍රීසි) - ඇමුණුම IV

එම සියලුම ලේඛන නිසි පරිදි සම්පූර්ණ කොට එවන ලෙස උපදෙස් දෙනු ලැබේ.

09.අභිමතය ප්‍රකාශ කිරීමේ ආකෘති පත්‍රයේ තමා කැමති සේවා ස්ථානය ලකුණු කිරීමේදී තම කුසලතා අංකයට සමාන හෝ වැඩිපුර සේවා ස්ථානයන් ප්‍රමාණයක් නම්කරන ලෙසට සියලුම අයදුම්කරුවන්ට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

10.අදාල අයදුම්පත්‍රය අධ්‍යක්ෂ (දන්ත සේවා) විසින් මුද්‍රා තැබූ පසු අභිමතය ප්‍රකාශ කිරීමේ ලේඛනයෙහි ඇති ප්‍රමුඛතා ලැයිස්තුව සංශෝධනය කිරීමට අවසර ලබා දෙනු නොලැබේ.

11.විශේෂ අවස්ථා යටතේ කරනු ලබන ඉල්ලීම් වල ස්වභාවය අනුව විවාහ සහතිකය (මුල් පිටපත්) ඉදිරිපත් කිරීමට සිදුවිය හැකිය.

12.අත්‍යවශ්‍ය අවස්ථාවකදී පමණක් තොරතුරු දැන ගැනීම සඳහා දුරකථන අංක 0706491306 ඇමතිය හැකිය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවෙහි අනුමැතිය පරිදි

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය. අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
2026.10.21

* අංක 07 හි සඳහන් අවසන් දිනයට (2026.11.08) අයදුම්පත්‍රය හා අභිමතය ප්‍රකාශ කිරීමේ ලේඛනය ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.( අංක 06 හි සඳහන් ලේඛන අයදුම්කරුවන් අධ්‍යක්ෂ (දන්ත සේවා ) වෙත මේ වන විට ලබා දී තිබේනම් නැවත ලබා දිය යුතු නොවේ)